# ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම

# THE ORIENTAL STUDIES SOCIETY OF SRI LANKA

අධ්‍යාපන අමාත්‍යාංශය
Ministry of Education

දුරකථන Telephone Nos.

සභාපති President } 22784812

ලේකම් Secretary } 2784893

කාර්යාලය Office } 0112 785047

ඊ මේල් E Mail: pracheenabhasha@gmail.com

Facebook – pracheenabhasha

ඉසුරුපාය
බත්තරමුල්ල
"Isurupaya"
Battaramulla.


මගේ අංකය My No. } ප්‍රා.භා.ස /සේ/සැ/ii

ඔබේ අංකය Your No. }

දිනය Date } 05. 01. 2018

---

කෘත්‍යාධිකාරී / පරිවේණාධිපති / පරිවේණාචාර්ය ස්වාමීන් වහන්ස,
පරිවේණාචාර්ය මහත්මයාණෙනි,

**<u>ප්‍රාචීන මධ්‍යම හා අවසාන සේවාපූර්ව පුහුණු පාඨමාලාව 2017 (2018)</u>**

සෑම වසරක ම ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන උක්ත පාඨමාලා 2017 (2018) විභාග වර්ෂ සඳහා ද මෙවරත් ජනවාරි සිට අප්‍රේල් දක්වා පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

02. විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්ගේ හා කථිකාචාර්යවරුන්ගේ මෙහෙයවීමෙන් ප්‍රාචීන මධ්‍යම පරීක්ෂණය හා ප්‍රාචීන පණ්ඩිත අවසාන උපාධි පරීක්ෂණය ඉලක්ක කොට පැවැත්වෙන මෙම පාඨමාලා පිරිවෙන් ගුරුවරුන් උදෙසා සංවිධානය කරනු ලබයි.

03. බොහෝ පරිවේණාචාර්යවරු ප්‍රාචීන මධ්‍යම විභාගය සමත් ව පත්වීම් ලබා පිරිවෙන්වල ඉගැන්වීම් කටයුතු සිදු කරන අතර ප්‍රාචීන පණ්ඩිත අවසාන උපාධිය සම්පූර්ණ කිරීමට උත්සුක නො වෙති.

04. ප්‍රාචීන මධ්‍යම විභාගය සමාන වන්නේ විශ්වවිද්‍යාලයක ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණයටය. ( G.A.Q ) එබැවින් මධ්‍යම පරීක්ෂණය සමත් ගුරුභවතුන් අනිවාර්යයෙන් ම අවසාන පරීක්ෂණය සමත් ව සුදුසුකම් සපුරාගත යුතු ය. එසේ නොවන මධ්‍යම පරීක්ෂණය පමණක් සමත් ගුරු භවතුන්ගේ සේවය වසර පහක් අවසානයේ අවලංගු වේ.

05. පිරිවෙණක පත්වීමක් ලබා සේවය කරන ගුරුවරුන් ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම හා අවසාන යන පන්තිවල ඉගැන්වීමට සුදුස්සන් විය යුතු ම ය.

06. අඩු සුදුසුකම් සහිත ගුරුවරුන් සේවයේ යෙදී සිටීම පිරිවෙණටත් ශිෂ්‍යයන්ටත් ඵලදායක සේවයක් ලැබීමට බාධාවකි. එබැවින් මධ්‍යම පරීක්ෂණය පමණක් සමත් ගුරුභවතුන් අවසාන පරීක්ෂණය සමතුන් කර ගැනීම කෘත්‍යාධිකාරීගේ හා පරිවේණාධිපතිගේ වගකීමක් ද වේ.

07. මේ අනුව පිරිවෙන් ගුරුභවතුන්ගේ සේවා සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමට ආධාරයක් ලෙස ඉහත කී විභාග පූර්ව සේවාපූර්ව පුහුණු පාඨමාලා සංවිධානය කෙරේ. ඊට සහභාගීවන ගුරුවරුන්ගෙන් කිසිදු ගාස්තුවක් අය නොකෙරෙන අතර මේ සඳහා සහභාගීවන සැමට දිවා දානය / ආහාර, උදේ සවස ගිලන්පස / තේ නොමිලේ සපයනු ලැබේ.

08. පාඨමාලා පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි ය.

| | පාඨමාලාව | ස්ථානය | ආරම්භය |
|---|---|---|---|
| 1 | ප්‍රාචීන මධ්‍යම | පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණ | 2018. 01. 13 පෙ.ව. 08.30 - ප.ව. 04.00 |
| 2 | ප්‍රාචීන පණ්ඩිත අවසාන උපාධි | පූර්වාරාමය, අංක 47, පූර්වාරාම පෙදෙස, ගුණසිංහපුර, කොළඹ 12. | 2018. 01. 13 පෙ.ව. 08.30 - ප.ව. 04.00 |

[signature]

මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි
ලේකම්,
ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම,
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්),
අධ්‍යාපන අමාත්‍යාංශය.

Scanned by CamScanner